**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය - 2015**

**---------------------------------------------------**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ 38 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

------------------------------------

ප්‍රමිතයේ 29 හා 15 වගන්ති ප්‍රකාරව තීරණ ගැනීමේදී ප්‍රමාණාත්මකව වැදගත් වන විෂයයන් වෙන්ව නිරූපනය කල යුතු වුවත්, වටිනාකම රු.67,595,691 ක් වූ මණ්ඩලයේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම්වල අගය එක්ව දක්වා තිබුණි. එසේම ඉඩම් වැඩිදියුණු කිරීම් සඳහා වූ රු.577,667 ක්වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ඉඩම් යටතේම ගලපා තිබුණි.

(ආ) ශ්‍රීලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

----------------------------------

ප්‍රමිතයේ 36 වගන්තිය අනුව, යම් වත්කම් පන්තියක ප්‍රත්‍යාගණනයක් සිදු කරන්නේ නම් ඊට අදාළ සියලු වත්කම් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ වත්කම් ප්‍රත්‍යාගණනයේදී මණ්ඩලය භාවිතා කරන මෝටර් වාහන 40 ක් අතුරින් මෝටර් වාහන 25 ක් පමණක් ප්‍රත්‍යාගණනයට ලක් කර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 20

------------------------------------

ප්‍රමිතයේ 24 සිට 29 දක්වා වගන්තිවලට අනුකූලව කටයුතු කිරීමෙන් තොරව 2015 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු රු.36,509,323 ක් වූ විශේෂ ව්‍යාපෘතීන් සඳහා වූ රාජ්‍ය ප්‍රදාන, ජංගම වත්කම් යටතේද එදිනට මණ්ඩලය වෙත ලැබී තිබුණු රු.71,715,838 ක් වූ මුළු රාජ්‍ය ප්‍රදාන, ජංගම නොවන වගකීම් ලෙසද දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 36

----------------------------------

භාවිතයෙන් ඉවත් කර තිබූ ප්‍රත්‍යාගණිත අගය රු. මිලියන 2.5 ක් වටිනා ජංගම තාක්ෂණ සේවා බස් රථය සම්බන්ධයෙන් ප්‍රමිතයේ ප්‍රකාරව හානිකරණය සඳහා ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

-----------------------------------

සෙමෙන් චලනය වන හා යල්පැනගිය තොග වෙනුවෙන් වෙන්කිරීම් රු.3,048,557 ක් ප්‍රමිතයේ 29 වගන්තිය ප්‍රකාරව කිසිදු සමාලෝචනයකින් තොරව 2013 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, යන්ත්‍රෝපකරණ, විවිධ වත්කම් සහ පරිගණක යන වත්කම් කාණ්ඩ තුළ පිළිවෙලින් එම කාණ්ඩවලට අයත් නොවන එකතු වටිනාකම රු.2,703,783 ක් වූ වෙනත් වත්කම් ඇතුළත් වී තිබූ අතර ක්ෂය අනුපාත එකිනෙකට වෙනස්වීම හේතුවෙන් එම වත්කම්වල ශුද්ධ අගය නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලය විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 03 කට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් තැන්පතු ශේෂය රු.2,300,062 ක් වූ අතර මෙම ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්මික ජනපද අංශයෙන් ලබාදුන් වාර්තා අනුව, 2015 දෙසැම්බර් 31 දිනට කාර්මික ජනපදවල කර්මාන්තකරුවන්ගෙන් මණ්ඩලයට අයවිය යුතු මුදල සහ එදිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හිඟ ශේෂය අතර එකතුව රු.13,473,162 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව, දේපල පිරියත හා උපකරණ වල ධාරණ අගය සහ ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ ශේෂයන් අතර එකතුව රු. 6,232,030 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසන් තොග ලෙස දක්වා තිබූ තොග අයිතමයන් 14 කට අදාළ ශේෂයන්ගේ එකතුව තොග සමීක්ෂණ වාර්තාව සමග සැසඳීමේදී රු.522,972ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, අබලි යකඩ එක් රැස් කර විකිණීමේ ව්‍යාපෘතියේ තොග වටිනාකම රු.8,458,614 ක් වුවද විගණනය සඳහා ලබාදුන් තොග වාර්තා අනුව එම වටිනාකම රු.2,746,359 ක් වූයෙන් රු.5,712,255 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ මිලදීගෙන තිබූ අබලි යකඩ තොගයේ වටිනාකම රු.78,105,492 ක් වුවත් ඊට අදාළ උපලේඛනය අනුව එම වටිනාකම රු.67,397,042 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් පවත්වන ලද පුහුණු වැඩ සටහන් වලින් ලද ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය අංශයේ ආදායම් වාර්තා සහ එම වැඩසටහන් සංවිධානය කරනු ලැබූ මණ්ඩලයේ එක් එක් අංශවල වාර්තා අතර එකතුව රු.5,582,169 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ රු.1,113,704 ක ශේෂයක් නිරීක්ෂණය වූ අතර ඉන් රු.374,027 ක ශේෂ 2017 ජුනි 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සේවා ආදායම් තුළ ඇතුළත්ව තිබුණු රු.4,047,845 ක අභ්‍යන්තර විකුණුම් ආදායම සනාථ කරගැනීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මණ්ඩලයේ වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු මණ්ඩලයේ සේවයේ නිරත දේපළ තක්සේරුව පිළිබඳ වෘත්තීය සුදුසුකම් සහිත නිලධාරියෙකු විසින් සිදු කර තිබූ අතර, ප්‍රත්‍යාගණනය කරන ලද යන්ත්‍ර උපකරණ හා වෙනත් වත්කම් වල උපලේඛණය, 2015 දෙසැම්බර් 31 දිනට එම වත්කම් කාණ්ඩ යටතේ ලබාදෙන ලද වෘත්තීමය තක්සේරුව යනාදී තොරතුරු 2017 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොවීය.

(ඇ) වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබූ ලක්කම් ණයහිමි ගිණුමේ පැවති රු.1,407,159 ක් වූ අසාමාන්‍ය හර ශේෂය සහ ජංගම බැරකම් යටතේ දක්වා තිබූ රු.1,930,587 ක බැර ශේෂය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පැහැදිලි කිරීම් සහ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබූ එකතුව රු.8,765,537 ක කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර එම ශේෂයට එරෙහිව මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදු කර තිබුණි. තවද, වෙනත් ජංගම වත්කම් යටතේ වර්ෂ ගණනාවක් තිස්සේ අඛණ්ඩව දක්වා තිබූ එකතුව රු.15,597,281 ක් වූ අක්‍රීය ශේෂ, නිවැරදිව හඳුනාගෙන අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2011 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට එකතුව රු.2,443,961 ක තැන්පතු හා කලින් ගෙවීම් අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවතුන අතර ඊට අදාළ උපලේඛන සමග පොදු ලෙජරයේ ඇතුළත් වූ සංඛ්‍යා කාලීනව සැසඳීම් නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.27,259,111 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.419,312 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.26,839,799 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව පුනරාවර්තන ප්‍රදාන රු.46,750,000 කින් ඉහළ යාම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූලා ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.6,757,459 ක් වූ ඌනතාවය 2013 වර්ෂය වන විට රු.84,728,727 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2014 වර්ෂයේදී රු.419,312 ක අතිරික්තයක් ඇති වී තිබුණි. කෙසේ වුවද, මූලා ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ දායකත්වය හිතකර අගයක් ගෙන තිබූ අතර, 2011 වර්ෂයේදී එය රු.239,876,864 ක් වී තිබුණි. එහෙත් 2012 වර්ෂයේදී එය රු.224,882,033 ක් දක්වා අඩුවී තිබුණද ඉන්පසු වර්ෂවලදී අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.376,186,473 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනත යටතේ සංස්ථාපනය කරන ලද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන අරමුණ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, හා සංවර්ධනය කිරීම වන අතර , කාර්මික ජනපද 19 ක් හා ප්‍රාදේශීය කාර්යාල 25 ක්ද, ඇතුළත්ව ඉංජිනේරු තාක්ෂණික සේවා, අලෙවි, රබර් සංවර්ධන සහ සම්භාණ්ඩ සංවර්ධන යනාදී අංශයන්ගෙන් සමන්විත වේ. මණ්ඩලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායමින් සියයට 49 ක් නියෝජනය වී තිබුණේ අබලි යකඩ එක් රැස්කර විකිණීමේ ව්‍යාපෘතියේ කටයුතුවලින් ලැබී තිබූ අතර මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන වාත්තු අංශය, වැඩ හල, සේවා මධ්‍යස්ථාන සහ අනෙකුත් මෙහෙයුම් කටයුතු වලින් ආදායමට ලැබී තිබුණේ සියයට 14 ක් වූ අවම දායකත්වයකි. මේ අනුව මණ්ඩලයේ මූලික අරමුණු ඉටුකරනු ලබන අංශ වල කාර්යසාධනය ඵලදායී නොවූ බව නිරීක්ෂණය විය.

(ආ) කාර්මික තාක්ෂණ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් පිහිටුවන ලද තාක්ෂණික සේවා අංශය ප්‍රධාන ක්‍රියාකාරකම් 08 ක් යටතේ ක්‍රියාත්මක වන අතර එම අංශය මගින් සමාලෝචිත වර්ෂය තුළ තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් 05 ක් පමණක් පවත්වා තිබීමෙන් කාර්මික තාක්ෂණ දැනුම හුවමාරු කිරීමේ ප්‍රගතිය මන්දගාමී බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රබර් සංවර්ධන අංශය මගින් ක්‍රියාකාරකම් 14 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණු නමුත් නව ව්‍යාපාර බිහි කිරීම සහ විදේශීය වෙළඳපල ඉලක්ක කර ගත් ගුණාත්මක නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමුඛ ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) මණ්ඩලයේ ඉංජිනේරු අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉංජිනේරු අංශය මගින් පවත්වා ගෙන යන වැඩහල මගින් නව නිර්මාණ බිහි කිරීම අපේක්ෂා කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු නව නිර්මාණයක් බිහි කර නොතිබුණි. තවද ඉකුත් වර්ෂ 03 ක කාලය තුළ කර්මාන්තකරුවන් වෙත නව නිර්මාණ 02 ක් පමණක් හඳුන්වාදීම තුළින් වැඩහල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව, පන්නල පිහිටි යෝග්‍ය තාප මධ්‍යස්ථානය මගින් බාහිර ආදායම් ජනනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් 229 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණද, ක්‍රියාකාරකම් 68 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. තවද මණ්ඩලයේ වාත්තු අංශය මගින් ක්‍රියාකාරකම් 100 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණේ ක්‍රියාකාරකම් 10 ක් පමණි.

(iii) ශ්‍රී ලංකාව තුළ වාත්තු කටයුතු සම්බන්ධව තාක්ෂණික උපකරණ වර්ධනය කිරීම සඳහා රු 18,643,306 ක් වටිනා යන්ත්‍ර 1996 වර්ෂයේදී ජපන් රජයේ ආධාරයක් වශයෙන් මණ්ඩලය වෙත ලැබී තිබුණු නමුත් අදාළ යන්ත්‍ර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කළ හැකි වන පරිදි පුහුණු වැඩ සටහන් පැවැත්වීමට මණ්ඩලයේ ඉංජිනේරු අංශය කටයුතු කර නොතිබුණි.

(ඉ) කාර්මික තොරතුරු බාහිර පාර්ශවයන් වෙත සන්නිවේදනය කිරීම මණ්ඩලයේ සැලසුම් අංශය සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත සංගණනයක් පැවැත්වීමට සැලසුම් කර තිබුණු නමුත් එවැනි සංගණනයක් පවත්වා නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය පිහිටි මොරටුව කටුබැද්දේ පිහිටි ඉඩමේ නෛතික අයිතිය හා මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබු අතර දීර්ඝ කාලයක් තිස්සේ වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

## 4.3 මූල්‍ය කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ අයවැය ලේඛනය අනුව, ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනය රු.45,000,000 ක් වූ අතර එම මුදල වර්ෂය තුළ උපයෝජනය කිරීමට හැකි වන අයුරින් ප්‍රසම්පාදන කටයුතු කාලීනව සැලැසුම් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා වූ ප්‍රතිපාදනයෙන් රු.19,280,501 ක් පුනරාවර්තන වියදම් වශයෙන් උපයෝජනය කර තිබුණි. තවද, ඉදිකිරීම් කටයුතු සඳහා රු.6,500,000 ක මුදලක් වෙන්කර තිබුණු නමුත් ප්‍රසම්පාදන සැලැස්මේ සඳහන් නොවූ ඉදිකිරීම් කාර්යයන් 08 ක් සඳහා රු.2,784,253 ක් වැය කර තිබුණි.

(ආ) අබලි යකඩ සැපයුම්කරුවන් වෙත සම්පූර්ණ වටිනාකම අත්තිකාරම් වශයෙන් පළමු අවස්ථාවේදීම ගෙවා තිබුණු නමුත් අදාළ අබලි යකඩ නිශ්චිත කාල සීමාවක් තුළදී සපයා නොතිබුණි. මේ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ද්‍රව්‍ය සැපයීමකින් තොරව රු.3,249,428 ක් සැපයුම්කරුවන් අත රඳවා ගෙන තිබුණි.

## 4.4 හඳුනාගත් පාඩු

-----------------

මණ්ඩලය විසින් සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් නියමිත පරිදි ගණනය කර ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.39,965,665 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පිරිවැය රු.18,643,856 ක් වූ ස්පෙක්ට්‍රෝ මීටර් ඕර්ස් 5500 නැමැති උපකරණය 2012 වර්ෂයේ සිට අක්‍රීය තත්ත්වයෙන් ඉංජිනේරු අංශයේ ගබඩා කර තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කාර්ය මණ්ඩලය, 714 කින් සමන්විත වන අතර 2015 දෙසැම්බර් 31 දිනට සේවකයින් 227 ක පුරප්පාඩු පැවතුණි. මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු වන අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 02 ක්, අධ්‍යක්ෂ තනතුරු 04 ක්, සහකාර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 15 ක් හා සංවර්ධන නිලධාරි තනතුරු 30 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ පුරප්පාඩු වී පැවතුණි. තවද, ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරී තනතුරු 94 ක් අනුමත වී පැවතියද ඉන් තනතුරු 86 ක් වර්ෂයට වැඩි කාලයක සිට පුරප්පාඩුව පැවතුණි. කෙසේ වෙතත්, ඉහත තනතුරු පිරවීමකින් තොරව විදුලි ඉංජිනේරු, මණ්ඩලීය ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, විධායක අධ්‍යක්ෂ හා උපදේශක තනතුරු සඳහා පුද්ගලයින් 09 දෙනෙක් කාර්ය පැවරුම් පදනම මත බඳවා ගෙන තිබුණු අතර ඔවුන්ගේ දීමනා වශයෙන් රු.430,000 බැගින් මාසිකව වැය කර තිබුණි. මේ අතුරින් උපදේශක හා විධායක අධ්‍යක්ෂ යන තනතුරු බඳවා ගැනීමේ පරිපාටියට ඇතුළත් වී නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) මණ්ඩලයේ කටයුතු ජනගත කිරීම සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් දිවයින පුරා අනුයුක්ත කිරීම අවශ්‍ය කරුණක් වුවත්, කිලිනොච්චිය, නුවරඑළිය, පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලවලට අවම වශයෙන් එක් ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරියෙකුවත් අනුයුක්ත කර නොතිබුණි. කෙසේවෙතත්, මාතර දිස්ත්‍රික් කාර්යාලයේ ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරින් 05 දෙනෙකු වෙනුවට 06 දෙනෙකු අනුයුක්ත කර තිබුණි. තවද, මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ප්‍රාදේශීය සංවර්ධන අංශය සහ ගාල්ල, පුත්තලම, රත්නපුර දිස්ත්‍රික් කාර්යාලවල කළමනාකරණ සහකාර නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අනුයුක්ත කර තිබුණු අතර කිලිනොච්චිය, මන්නාරම හා කෑගල්ල දිස්ත්‍රික් කාර්යාල වලට එක් නිලධාරියෙක් හෝ අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) වංචනික ක්‍රියාවන්ට සම්බන්ධ මණ්ඩලයේ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමීව සිදුවන බව නිරීක්ෂණය විය. ඒ අනුව පතරොම් කොපු අක්‍රමිකතාවයකට සම්බන්ධ නිලධාරියෙකු 2010 සැප්තැම්බර් 09 සිටද, තාක්ෂණික සේවා අංශයේ මුදල් අවභාවිතයක් සම්බන්ධ නිලධාරියෙකු 2014 දෙසැම්බර්19 සිටද, මඩකලපුව වාරි මාර්ග කාර්යාලයෙන් අබලි යකඩ මිලදී ගැනීම සම්බන්ධ ගනුදෙනුවට චෝදනා ලත් නිලධාරියෙකු 2012 ඔක්තෝබර් 16 සිටද වැඩ තහනමකට ලක්කොට ඇතත් ඉදිරි විනය ක්‍රියාමාර්ග 2015 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) 1969 අංක 36 දරන කර්මාන්ත මණ්ඩල පනතේ 17 (අ) වගන්තියට පටහැනිව 2015 පෙබරවාරි 15 දිනැති අංක 116/ඒබීඩී/අයිඩීබී දරන ලිපිය මගින් වාණිජ හා කර්මාන්ත කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් නොවූ විධායක අධ්‍යක්ෂක තනතුර සඳහා නිලධාරියෙකු පත් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තා හා ගිණුම් මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මණ්ඩලය විසින් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම අඛණ්ඩව ප්‍රමාද කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 22 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2017 සැප්තැම්බර් 13 විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. 2015 දෙසැම්බර් 09 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2015 දරන චක්‍රලේඛයේ 3.3 වන ඡේදය අනුව, වාර්ෂික ගිණුම් නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ප්‍රසාද දීමනා ලබාගැනීම සඳහා ඉටුකළ යුතු පූර්ව කොන්දේසියක් වුවද උක්ත චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව රු.4,042,375 ක ප්‍රසාද දීමනාවක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණි.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

---

සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම තුළ මණ්ඩලයේ අංශවල ප්‍රාග්ධන අවශ්‍යතාවයන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

---

මණ්ඩලයේ එක් එක් අංශ මගින් වාර්ෂික අයවැය ලේඛන වෙන් වෙන්ව පිළියෙල කර තිබුණු නමුත් මණ්ඩලය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

---

1971 අංක 38 දරන මුදල් පනත අනුව, වාර්ෂික වාර්තාව අදාළ වර්ෂය ඉකුත් වී මාස 10 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2013 හා 2014 වර්ෂ සඳහා වූ වාර්ෂික වාර්තා 2017 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මූල්‍ය පාලනය | i. | බැංකු සැසඳුම් ප්‍රකාශන ඊළඟ මාසයේ 15 දිනට පෙර ඉදිරිපත් නොකිරීම. |
| | ii. | මුදල් තැන්පත් කිරීම හා ලදුපත් නිකුත් කිරීම අතර දිනයන් හි සැලකිය යුතු කාල පරාසයක් තිබීම. |
| | iii. | නිශ්චිත සැපයුම්කරුවන්ගෙන් වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය හඳුනාගත හැකි වන පරිදි ගිණුම් පද්ධතිය පවත්වා නොතිබීම හා මෙම ගිණුම් පද්ධතියේ ඇතුලත් කරන දත්ත වගකිව යුතු නිළධාරියකුගේ අධීක්ෂණයට ලක් නොවීම. |
| | iv. | විවිධ අංශ වල මූල්‍ය ගනුදෙනුවලට අදාළ ලියකියවිලි ගිණුම් අංශය වෙත කාර්යක්ෂමව රැස් නොකිරීම. |
| (ආ) පුහුණු වැඩ සටහන් පැවැත්වීම | i. | මණ්ඩලයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉලක්ක කරන ලද වැඩ සටහන් සකස් නොවීම හා පසුවිපරම් නොකිරීම. |
| | ii. | සම්පත් දායකයින් තෝරාගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් නොතිබීම. |
| | iii. | වැඩ සටහන්වලට අදාළ අයවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරීම. |
| (ඇ) ඉඩම් බදුදීම | i. | මණ්ඩලය සතු ඉඩම් හා ගොඩනැගිලි බදු දීමේ ක්‍රමවේදයක් නොතිබීම. |
| | ii. | බදු ගිවිසුම් අත්සන් නොකර පැවතීම. |
| | iii. | කාර්මික ජනපද වල මණ්ඩලය විසින් බදු පදනම මත ඉඩම් ලබාදුන් කර්මාන්ත පිළිබඳ පසු විපරම් නොකිරීම. |